// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2366/12 - 2024 ජනවාරි මස 09 වැනි අඟහරුවාදා - 2024.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### නවගත්තේගම ප්‍රාදේශීය සභාව

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති ''වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළකිරීම පිළිබඳ නියෝග'' මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 2023.07.28 දින හා අංක 2342/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබූ නිවේදනයේ ඇතුළත් උපලේඛනයේ නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සලකනු ලැබූ පාරවල් සහ පටු මාවත් අතරින්, එකී නිවේදනයෙන් නියම කර ඇති දිනයට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා නැති පාරවල් හා පටු මාවත් සියල්ල ම නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට 2023.12.07 දිනැති තීරණ පොතේ තීරණ අංක 398 යටතේ තීරණය කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී පාරවල් හා පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් මෙහි උප ලේඛනයේ ඇතුළත් කර ඇති අතර එහි ඇතුළත් සෑම පාරක් ම සහ පටු මාවතක් ම, ප්‍රාදේශිය සභා පනතේ 24 වන වගන්තියේ (5) උපවගන්තිය යටතේ නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති පාරවල් සහ පටු මාවත් ලෙස සලකනු ලැබිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**එම්. ඩබ්. එල්. සෝමචන්ද්‍ර,**
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 07 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## තීරණය

"වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 2023.12.07 දිනැති තීරණ පොතේ තීරණ අංක 398 අනුව, 2023.07.28 දින අංක 2342/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාමලේඛනයේ දැක්වෙන පාරවල් හා පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් ලෙස සලකනු ලැබිය යුතු බව නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඩබ්. එම්. එල්. සෝමචන්ද්‍ර වන මම තීරණය කරමි.

මාර්ග විස්තරය.

| *ID* | *R. NUMBER* | *R.NAME* | *AUTHORITY* | *TYPE* | *SL.COOR.L* | *ST.COOR.R* | *END.COOR.L* | *END.COOR.R* | *LENGHT* | *WIDTH* | *DVE.WIDTH* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 432 | NWP/NGP/ B201/8/A | තම්මැන්නාවැටිය වැ කන්ද පාර | PS | GRV | 310488.345, 121212.23 | 310072.848, 121139.967 | 310491.61, 121209.052 | 310073.346, 121135.105 | 448.08 | 2.4 | 2 |
| 435 | NWP/NGP/ B19/21/C | බෝගහවැව දහය කණුව පාර මුල කොටස | PS | GRV | 309785.711, 125309.574 | 319787.144, 125313.539 | 309867.318, 125261.864 | 309869.098, 125265.945 | 107.2 | 3 | 2.4 |
| 436 | NWP/NGP/ B19/21/D | පොළපාර අක්කර දහය පාර මුල කොටස | PS | GRV | 309775.944, 125320.391 | 309772.495, 125315.561 | 309718.839, 125400.959 | 309716.939, 125400.094 | 111.68 | 2.4 | 2 |
| 433 | NWP/NGP/ B19/21/A | නවගත්තේගම ප්‍රාථමික විදුහල පාර | PS | BP | 310095.244, 125621.322 | 310093.805, 125619.539 | 309998.829, 125738.676 | 309995.151, 125733.387 | 153.98 | 4.6 | 3.1 |
| 434 | NWP/NGP/ B19/21/B | රාජා හෝටලය අසල පාර | PS | GRV | 309925.419, 125459.479 | 309923.866, 125457.984 | 309739.749, 125615.859 | 309739.607, 125614.423 | 249.24 | 2.4 | 2 |
| 437 | NWP/NGP/ B201/9/8/A | සමෘද්ධිගම අටවන අතුරු පාර | PS | GRV | 314078.169, 121338.074 | 314080.302, 121337.792 | 314074.276, 121125.001 | 314076.292, 121125.35 | 216.01 | 3 | 2.4 |
| 438 | NWP/NGP/ D199/6/A | හේමපාල මහතාගේ නිවස අසල පාර | PS | GRV | 309897.017, 127056.495 | 309893.605, 127051.964 | 309769.368, 127278.524 | 309767.152, 127278.79 | 267.42 | 3.75 | 3 |

EOG 01 - 0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.